# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1878/7 – 2014 සැප්තැම්බර් 01 වැනි සඳුදා – 2014.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/07/10/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වතු සේවා සංගමය (ජේ. එම්. එස්. බණ්ඩාර මයා වෙනුවෙන්), අංක. 26, මාලිගාව මාවත, සීතාවක, අවිස්සාවේල්ල

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක. 54, කිරුළපන ඇවනිව්, කොළඹ 06

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිලියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක. 13/30 හි, සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.


1A – G 020185 – 72 (2014/09)

*සැ.යු.– මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.*

මගේ අංකය: IR/07/10/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වතු සේවා සංගමය (ජේ. එම්. එස්. බණ්ඩාර මයා වෙනුවෙන්), අංක. 26, මාලිගාව මාවත, සීතාවක, අවිස්සාවේල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක. 54, කිරුළපන ඇවනිව්, කොළඹ 06.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් උඩබාගේ වත්තේ සේවය කර මේ වන විට විශ්‍රාම ලබා සිටින ජේ. එම්. එස්. බණ්ඩාර මහතාට 1997 ජනවාරි මස සිට 2011 අප්‍රේල් මස දක්වා කාලයට අදාළව ගෙවල් කුලී දීමනාව ලැබීමට හිමිකම් ඇත්ද යන්න සහ එලෙස හිමිකම් ඇත්නම් ඔහුට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
වැ. බ. / කම්කරු කොමසාරිස්.

2014 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.
09 - 525

---

මගේ අංකය: IR/13/09/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩබ්. බී. සිරිපාල මයා, පලටුපාන ලේවාය, කිරින්ද, තිස්සමහාරාමය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, එදිරිසිංහ පාර, අංක. 148 හි, ඩබ්. ජී. එල්. වයි. එම්. විල්ලද්දර මෙනවිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/09/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩබ්. බී. සිරිපාල මයා, පලටුපාන ලේවාය, කිරින්ද, තිස්සමහාරාමය

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

හම්බන්තොට, ලංකා සෝල්ට් ලිමිටඩ් යටතේ පලටුපාන මහලේවායෙහි සේවය කළ ඩබ්. බී. සිරිපාල නමැති අයගේ වැඩ තහනම් කර සිටි, 1986.01.31 සිට 2004.11.01 දින කාල සීමාව සඳහා හිඟ වැටුප් සහ උසස්වීම් ලබා නොදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත්ද එසේ සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
වැ.බ. /කම්කරු කොමසාරිස්.

2014 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.
09 - 526

---

මගේ අංකය: IR/13/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ටී. එම්. ප්‍රියන්ත මයා, ලුණු නිලධාරි (IV ශ්‍රේණිය), ලංකා සෝල්ට් ලිමිටඩ්, හම්බන්තොට

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සීදුව, ලියනගෙමුල්ල, කොළඹ පාර, අංක. 42ඩී හි, කේ. ඒ. ටී. ප්‍රනාන්දු මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අගොස්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ටී. එම්. ප්‍රියන්ත මයා, ලුණු නිලධාරි (IV ශ්‍රේණිය), ලංකා සෝල්ට් ලිමිටඩ්, හම්බන්තොට

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

ලංකා සෝල්ට් ලිමිටඩ් හි සේවයේ නියුතු ටී. එම්. ප්‍රියන්ත මහතාට එරෙහිව කරන ලද විනය පරීක්ෂණයේ දී ලබා දී ඇති දඬුවම් යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්තිසහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
වැ.බ./කම්කරු කොමසාරිස්.

2014 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.
09 - 527

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.